උහන ප්‍රාදේශීය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 03 වැනි දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 04 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 06 දින සභාවේ සභාපතිවරයාට යවන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට උහන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීජ්/ශ්‍රීලරාඅගිප්‍ර දරන පලාත් පාලන සහ පලාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක ණය ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ සේවක ණය රු.290,401 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.359,959 ක් ලෙස රු.69,558 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ලේඛනය අනුව හිඟ වරිපනම් ආදායම රු.3,388,928 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.2,056,490 ක් ලෙස රු.1,332,438 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකුලී ලේඛනය අනුව හිඟ කඩකුලී ආදායම රු.80,073 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.186,839 ක් ලෙස රු.106,766 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුද්දර ගාස්තු ආදායම රු.1,566,803 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල මෙම අගය දක්වා නොතිබුණි.

(ඉ) ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ ආදායම රු.1,420,583 ක් වුවත් රු.1,429,435 ක් ලෙස ආදායම් වියදම් ගිණුමේ රු.8,852 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලේඛනය අනුව ශේෂය රු.2,891,695 වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.6,308,004 ක් ලෙස රු.3,416,305 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු උපයෝගීතා සේවා වැඩසටහන් (වැඩ සටහන් අංක 5)යටතේ කුලී ආදායම රු.1,405,216 ක් වුවත් රු.1,536,764 ක් ලෙස රු.131,548 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ යන්ත්‍රසූත්‍ර වලට අදාල අමතර කොටස් මිල දී ගැනීම් රු.461,270 ක පුනරාවර්ථන ස්වභාවයේ වියදම් ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබුණි.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

ගෙවිය යුතු වැටුප් රු. 34,065 සහ ගෙවිය යුතු මුද්දර ගාස්තු රු. 588,900 ක් නිරවුල් කිරීමට හෝ පොත් වලින් ඉවත් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් ලෙස වර්ෂ ගණනාවක සිට පෙන්වා තිබුණි.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

පහත සඳහන් ගිණුම් විෂයය ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබු බැවින් එම වටිනාකම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පරීක්ෂා තිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | විගණනයට ඉදිරිපත් නොකළ ලේඛණ |
|---|---|---|
| | රු. | |
| විවිධ ණය හිමියෝ | 54,358 | ණය හිමි ලේඛණය |
| පොදු සැපයුම් ණය හිමියෝ | 28,870 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

1.3.5 **නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකුල නොවීම**

ප්‍රාදේශය සභා රීති මාලාවේ රීති 153 අනුව ආදායම් හිඟ මුදල් පිළිබඳ ප්‍රකාශනයක් පී.එස්.07 ආකෘති පත්‍රය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කර ඇති ආදායම් සහ වියදම් ගිණුමට අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.1,209,426 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,463,414ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.253,988ක පසුබෑමක් පෙන්නුම් කෙරේ.

## 2.2 ආදායම් පරිපාලනය

------------------------

### 2.2.1 මුද්දර ගාස්තු

--------------------

2013 දෙසැම්බර් 31 දිනට රු.1,566,803 මුද්දර ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතුව තිබුණු අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 කර්මාන්ත බදු

--------------------

සභා ප්‍රාදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අය කල යුතු කර්මාන්ත හදුනාගැනීමට සහ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

------------------------------------------

වර්ෂ කිහිපයක සිට ප්‍රධාන කාර්යාලයේ හා උප කාර්යාලයේ පවත්වා ගෙන යන පුස්තකාලවල අස්ථානගත වූ වටිනාකම හදුනා නොගත් පොත් ප්‍රමාණය 364 ක් විය. තවද වර්ෂ කිහිපයක සිට රු.3,700 ක් වටිනා පොත් පාඨකයින් විසින් පුස්තකාලයට භාරදී නොතිබුණු අතර එයට අදාලව සිහිකැඳවීම් සිදුකිරීමට හෝ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් විගණිත දිනය වන 2013 ජූලි 21 දින වන විටත් ගෙන නොතිබුණි.

## 4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයක් පැවැති බැවින්, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂනය විය.

5. **පද්ධති හා පාලනය**

----------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) පුස්තකාල පොත් සම්බන්ධ පාලනය

(ඈ) හිඟ ආදායම් අයකරගැනීම

(ඉ) ලේඛන පවත්වාගෙන යාම